RTM 622

අධ්‍යක්ෂ, විභාගයෙන්

අණදෙන නිලධාරී
පොලිස් විශේෂ කාර්ය බලකාය/
පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය,
සියලුම කොට්ඨාස භාර නිලධාරීන්,
(ක්‍රියාකාරි/ ප්‍රාදේශිය)
අංශ ප්‍රධානි , EU අංශය,
ER අංශය, පොලිස් මූලස්ථානය

<u>පොලිස් සේවයේ පරිවාස / වැඩබලන සහකාර පොලිස් අධිකාරිවරුන්/ වරියන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය 2018 II</u>

ශ්‍රී ලංකා පොලිසියේ පරිවාස/ වැඩ බලන සහකාර පොලිස් අධිකාරිවරුන්/ වරියන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සහ දෙවන භාෂා වාචික පරීක්ෂණය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කරන ස්ථානයකදී 2023 පෙබරවාරි මස පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන 2005.04.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ 2019.07.19 දිනැතිව ජාතික පොලිස් කොමිෂන් සභාවේ අංක NPC/ED/GO/06/10/15 යටතේ අනුමැතිය ලත් ශ්‍රී ලංකා පොලිසියෙහි විධායක සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියෙහි දක්වා ඇත.

03. විභාගය පිළිබඳ විස්තර

ප්‍රශ්න පත්‍රයේ අංකය	ප්‍රශ්න පත්‍රයේ නම	කාලය	මූළු ලකුණු	සමත් ලකුණු
81	දණ්ඩ නීති සංග්‍රහය සහ පොලිස් ආඥා පනත	පැය 03	100	40
80	මූලික අයිතිවාසිකම්, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත	පැය 03	100	40
12 13	සිංහල භාෂා වාචික පරීක්ෂණය දෙමළ භාෂා වාචික පරීක්ෂණය	-	100	40

04. විභාගය පවත්වනු ලබන නිලධාරියා - විභාග කොමිසාරිස් ජනරාල්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
දණ්ඩ නීති සංග්‍රහය සහ පොලිස් ආඥා පනත	(පැමුණුම 3 ලෙස යාකර ඇත.)
මූලික අයිතිවාසිකම්, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත	(පැමුණුම 3 ලෙස යාකර ඇත.)
භාෂා වාචික පරීක්ෂණය (සිංහල/ දෙමළ)	(ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදයකට අනුව පරීක්ෂණය පවත්වනු ලබයි)

06. එක් නිලධාරියකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත විෂයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

07. විභාගයේ භාෂා මාධ්‍යය

i. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

ii. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුයි.

iii. අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීම සඳහා පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරග විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රාජ්‍ය සේවයට ඇතුළු වීමේදී රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

08. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළි වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. අයදුම්පත් මේයට යා කර ඇති ආකෘතියට අනුව A4 කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් ඉදිරිපත් කළ යුතුය. (අයදුම්පතේ අංක 1.0 සිට 1.3 තෙක් ඡේදයන් පළමුවන පිටුවෙහිත් ඉතිරිය දෙවන පිටුවෙහිත් වන ලෙස සඳහන් කරන්න) අයදුම්පතෙහි විභාගයේ නම සිංහල/ දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

10. විභාග ප්‍රතිඵල

i. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

ii. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛන විභාග කොමසාරිස් ජනරාල් විසින් පොලිස්පති ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මූලස්ථානය වෙත ලබාදෙනු ඇත.

11. අයදුම්පත් 2022.12.22 දිනට හෝ ඊට පූර්ව අධ්‍යක්ෂ, පොලිස් විභාග කොට්ඨාසය, අංක 07, කොටා පෙරැසය, ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මාවත, කොළඹ 08 ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාසභාර නිලධාරියාගේ නිර්දේශය සහිතව ලියාපදිංචි තැපැල්වෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය. ලිපි කවරයේ

වීම පස ඉහළ කෙළවරේ විභාගයේ නම යෙදෙන් කළ යුතුය. නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ එදිනට පෙර නියමිත විභාග ශාස්තුව ගෙවා ලබා ගත් ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, අයදුම්කරුගේ අත්සන, කොට්ඨාස භාර නිලධාරියාගේ නිර්දේශය සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

13. ඉහත 12 වන ඡේදයේ සඳහන්ව ඇති අවශ්‍යතාවන් සපුරා ලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

14. I. සෑම අපේක්ෂයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

II. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීම වන අතර, ඒ සඳහා ජාතික හැඳුනුම්පත්, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය පමණක් පිළිගැනේ.

15. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ශාස්තු අය කිරීම තීරණය කර ඇත. අදාළ විභාග ශාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-03 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ එක් ධාරයක් පමණක් සිටින සේ ඇලවීමට කටයුතු කරන්න.

(අ) පළමු වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ශාස්තු අය නොකෙරේ)

(ආ) ඉන් පසු එක් වතාවක් සඳහා

සම්පූර්ණ විභාගය සඳහා	රු. 1000.00
එක් විෂයකට	රු. 500.00

සැ.යු. :- මුල් වතාවට කුමන හෝ විෂයකට අයදුම්කර එම විෂය සඳහා පෙනී නොසිට ඊලඟ වතාවේ අයදුම්කිරීමේදී විභාග ශාස්තුවලින් නිදහස් නොවන බව සැලකිය යුතුයි.

16. I. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

II. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වේ.

ජී.බී.ජේ.එස්.චන්ද්‍රසේකර බණ්ඩාර,
පොලිස් අධිකාරි,
වැඩබලන අධ්‍යක්ෂ,
පොලිස් විභාග කොට්ඨාසය

ජී.බී.ජේ.එස්. චන්ද්‍රසේකර,
(සාම විනිසුරු/මූල දිවයිනටම)
පොලිස් අධිකාරි / විභාග,
පොලිස් විභාග කොට්ඨාසය,
අංක. 07, කොටා වෙරසය,
ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මවාත,
කොළඹ 08.

ස්ථානාධිපති,
තොරතුරු කාමරය,

කරුණාකර මෙම පණිවිඩය අදාළ කොට්ඨාස වෙත කඩිනමින් බැහිර කිරීමට කටයුතු කරන්න.

පුද්ගලික සහකාර,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, (පරිපාලන)

එන්. සී. ඒ. ද සිල්වා
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි
පුද්ගලික සහකාර
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
(පරිපාලන)

ආදර්ශ අයදුම්පත.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ශ්‍රී ලංකා පොලිසියේ පරිවාස/ වැඩ බලන සහකාර පොලිස් අධිකාරිවරුන් / වරියන් සඳහා වන කාර්යක්ෂමතා තඩෙළුම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2018 II

(අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා 'අ' ඇමුණුමේ උපදෙස් බලන්න)

ඉල්ලුම් කරන විභාගය:

ලිඛිත පරීක්ෂණය - 1
වාචික පරීක්ෂණය - 2
ලිඛිත සහ වාචික දෙකටම - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ලිඛිත විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙන නොලැබේ.)

වාචික පරීක්ෂණයට ඉල්ලුම් කරන්නේ නම් එම වාචික පරීක්ෂණය

සිංහල වාචික පරීක්ෂණය - විෂය අංකය 12
දෙමළ වාචික පරීක්ෂණය - විෂය අංකය 13

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ලිඛිත පරීක්ෂණයට ඉල්ලුම් කරන විෂයය/ විෂයන් :-

(අදාළ අංකය/ අංක කොටුව තුළ ලියන්න.)

* මූලික අයිතිවාසිකම්, අපරාධ නඩු විධාන සංග්‍රහය හා සාක්ෂි ආඥා පනත - විෂය අංකය 80
* දණ්ඩ නීති සංග්‍රහය සහ පොලිස් ආඥා පනත - විෂය අංකය 81

1.0 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

උදා:- EKANAYAKA MUDIYANSELAGE NIMAL

.....

.....

1.2. සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්)

උදා :- ඒකනායක මුදියන්සේලාගේ නිමල් බණ්ඩාර

.....

.....

.....

1.3 විභාග ප්‍රවේශ පත්‍ර ඊවීම සඳහා රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

උදා:- POLICE HEADQUARTERS, COLOMBO 01.

.....

.....

2.0 ස්ත්‍රී / පුරුෂ භාවය :- [ ]

පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.0 උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

4.0 4.1 ජාතික හැඳුනුම්පත් අංකය :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.2 පොලිස් හැඳුනුම්පත් අංකය :- [ ][ ][ ][ ][ ]

5.0 5.1 වර්තමාන සේවා ස්ථානය පිළිබඳ විස්තර :-

කොට්ඨාශය :- ..... දිස්ත්‍රික්කය / ඒකකය: .....

5.2 දුරකථන අංකය :-

1. කාර්යාලය :- ..... 2. ජංගම :- .....

3. ෆැක්ස් :- .....

6.0 6.1 ගෙවන ලද විභාග ගාස්තුව :- රු : .....

6.2 ගෙවීම් කළ තැපැල් කාර්යාලය :- .....

6.3 ලදුපත් අංකය :- ..... 6.4 ගෙවීම් කළ දිනය :- .....

* ප්‍රථම වතාවට විභාගයට අයදුම්කරන අපේක්ෂකයින් විභාග ගාස්තු ගෙවිය යුතු නැත.

6.5 ලදුපතේ මුල් පිටපත පහත ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

[ ]

7.0 <u>අයදුම්කරුගේ ප්‍රකාශය.</u>

පරිවාස / වැඩ බලන සහකාර පොලිස් අධිකාරී / කාන්තා සහකාර පොලිස් අධිකාරී ..... වන මා විසින් සඳහන් කරන ලද ඉහත විස්තර නිවැරදි හා සත්‍ය බවට ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

.....

දිනය :- ..... අයදුම්කරුගේ අත්සන

8.0 <u>නිර්දේශය :-</u>

පරිවාස / වැඩ බලන සහකාර පොලිස් අධිකාරී / කාන්තා සහකාර පොලිස් අධිකාරී ..... කොට්ඨාශයේ සේවය කරන අතර, ඔහුගේ / ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- ..... කොට්ඨාශ භාර නිලධාරී,

(අනවශ්‍ය වචන කපා හරින්න) (නිල මුද්‍රාව)

සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය.

විෂය :- **01. දණ්ඩ නීති සංග්‍රහය සහ පොලිස් ආඥා පනත**

1:1 දණ්ඩ නීති සංග්‍රහය

- IV පරිච්ඡේදය - පොදු ව්‍යාතිරේක
- V පරිච්ඡේදය - අනුබලදීම
- VI පරිච්ඡේදය - රාජ්‍ය විරෝධී වැරදි
- VIII පරිච්ඡේදය - මහජන නියෝජිතයාට විරුද්ධ වැරදි
- X පරිච්ඡේදය - රජයේ සේවකයන්ගේ නීත්‍යානුකූල බලයට කරනු ලබන අපහාස
- XIV පරිච්ඡේදය - මහජන සෞඛ්‍යයට, ආරක්ෂාවට, පහසුවට, ශිෂ්ටාචාරයට සහ සදාචාරයට බලපාන වැරදි
- XV පරිච්ඡේදය - ආගම් හා සම්බන්ධ වැරදි
- XVI පරිච්ඡේදය - මනුෂ්‍ය ශරීරයට බලපාන වැරදි
- XVII පරිච්ඡේදය - මනුෂ්‍ය ශරීරයට බලපාන වැරදි
- XX පරිච්ඡේදය - සාපරාධී බය ගැනවීම නින්දා කිරීම හා හිරිහැර කිරීම

1:2 පොලිස් ආඥා පනත

- 55 වන වගන්තිය - පොලිස් ව්‍යවස්ථා
- 56 සිට 71 දක්වා වගන්ති - පොලිස් නිලධාරීන්ගේ යුතුකම් හා වගකීම්
- 77 සිට 79 දක්වා වගන්ති - පෙරහැර තහනම් කිරීමේ හා පාලනය කිරීමේ විධිවිධාන
- 80 සිට 81 දක්වා වගන්ති - ප්‍රසිද්ධ ස්ථානවලදී හෝ ඒවාට නුදුරුව පාවිච්චි කරන ශබ්දය උපදවන හෝ පතුරුවන උපකරණ භාවිතය විධිමත් කිරීම
- 82 සිට 87 දක්වා වගන්ති - යුතුකම් පැහැර හැරීම ආදිය දඬුවම්
- 88 වන වගන්තිය - නීති විරෝධී විය හැකි ක්‍රියාවන් සීමා කිරීම
- 89 සිට 103 දක්වා වගන්ති - සාමාන්‍ය විධිවිධාන ඉහත නිර්දේශය ආවරණය වන කරුණු සම්බන්ධව නිකුත් කර ඇති පොලිස්පති චක්‍රලේඛ පාලනය කිරීමේ විධිවිධාන

විෂය :- **02. මූලික මිනිස් අයිතිවාසිකම්, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත**

2:1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- III පරිච්ඡේදය
- 126 වන ව්‍යවස්ථාව

2:2 අපරාධ නඩු විධාන සංග්‍රහය

- I පරිච්ඡේදය - ප්‍රාරම්භය
- II පරිච්ඡේදය - අපරාධ අධිකරණවල බලතල
- III පරිච්ඡේදය - මහේස්ත්‍රාත් වරයන්ට, පොලිසියට සහ සිරහාරයට ගැනීම් කරන කැනැක්කන්ට ආධාර කිරීම් හා නොරතුරු සැපයීම්
- IV පරිච්ඡේදය - සිරහාරයට ගැනීම්, සිරහාරයෙන් පැනයාම් සහ නැවත සිරහාරයට ගැනීම්
- V පරිච්ඡේදය - පෙනී සිටින ලෙස බල කිරීමේ අධිකරණ විධාන
- VII පරිච්ඡේදය - සාමය ආරක්ෂා කිරීම් සඳහා සහ යහපත් හැසිරීම් සඳහා වූ ඇප (වගන්ති 81, 82 සහ 83 ඇතුලත්ව)
- VIII පරිච්ඡේදය - නීති විරෝධී රැස්වීම්
- IX පරිච්ඡේදය - මහජන පීඩා
- XI - පොලිස් නිලධරයන් වෙත හා පරීක්ෂකවරයන් වෙත තොරතුරු දැන්වීම් සහ විමර්ශනය කිරීම් සඳහා ඇති බලතල
- XII පරිච්ඡේදය - මහේස්ත්‍රාන්වරයන්ට හෝ සාම නිලධරයන්ට කරනු ලබන ප්‍රකාශ
- XIII පරිච්ඡේදය - පරීක්ෂණවලදී සහ නඩු විභාගවලදී අපරාධ අධිකරණවල අධිකරණ බලය පිළිබඳ
- XIV පරිච්ඡේදය - මහේස්ත්‍රාත් අධිකරණ ඉදිරියේ නඩු කටයුතු ආරම්භ කිරීම්
- XV පරිච්ඡේදය - ලඝු නොවන නඩු විභාග හා 2013 අංක 02 දරන අ.න.වි.ඝ. විශේෂ විධිවිධාන පනතේ හෝ තත්කාලයේ

බල පවත්නා ඒ හා සම්බන්ධ ප්‍රතිපාදන

- XVI - චෝදනාව
- XVII පරිච්ඡේදය - ලඝු ආකාරයෙන් නඩු විභාග කිරීමට මහේස්ත්‍රාත් අයිකරණයකට බලය ඇති අවස්ථාවන නඩු විභාග කිරීම
- X XVII පරිච්ඡේදය - කලින් කර ඇති නිදොස් කිරීම් හෝ වරදකරු කිරීම්
- ඇප පනත - -

2:3 සාක්ෂි ආඥා පනත

- II පරිච්ඡේදය - සිද්ධිවල සඳාළ භාවය
- IV පරිච්ඡේදය - වාචික සාක්ෂි
- V පරිච්ඡේදය - ලේඛනමය සාක්ෂි
- IX පරිච්ඡේදය - ඔප්පු කිරීමේ භාරය
- X පරිච්ඡේදය - රජයේ සේවකයන්ගේ නීත්‍යානුකූල බලයට කරනු ලබන අපහාස
- XII පරිච්ඡේදය - සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විමසීම